# ජවිපෙ කුරුමාණම මහින්දගේ නොහැකියාව ජාතිවාදී අරගලයට යොදා ගන්නයි

පඳුරට ගල් ගහපු එක නම් වැඩක් ඇති වැඩක් නුනත්, පඳුරෙන් එළියට පැන්න නයාට මුහුණ දෙන එක නම් යමර වැඩක් තමයි කියල ගොවියෙක් කියලා තියෙනව.

ආණ්ඩුව 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගැන අල්ලන අඩව්ව නම් කිසිම තේරුමක් ඇති වැඩක් කියලා අපට නම් පෙනෙන්නේ නෑ. එක දෙමළ සංවිධානයක් කියලා තිබුණා බඩේ ඇම්මට දීපු බෙහෙතෙන් අවරුදු විස්සකට පස්සේ බඩේ පිළිකාව හොඳ කරන්න පුළුවන් කියලා හිතනව වගේ වැඩක් කියලා.

කොහොමටත් කොටි සංවිධානය තියා ආනන්ද සංගරීවත් මේ යෝජනා ගැන විශ්වාසයක් තියලා නෑ. අඩමානෙට හරි එල්ලිලා ඉන්නේ ඩග්ලස් දේවානන්ද විතරයි. එයාට දන් වෙන කරන්න දෙයක් නෑනේ.

මේ විදියට බැළුවහම මේ ආණ්ඩුවේ කුරුමානම ගැන කිසිම විශ්වාසයක් තියන්න පුළුවන්කමක් නැතත් මේ යෝජනා නිසා ජනතා විමුක්ති පෙරමුණ දෙන්න යන ගේම් එක නම් බරපතල ප්‍රශ්නයක් වෙන්න පුළුවන්.

අපි දිගටම පෙන්වලා දුන්නා විමල් වීරවංශලා හදන්නේ නැගගෙන එන බඩගිනි අරගලය ජාතිවාදී ගින්නක් බවට පෙරල ගන්න කියලා. මේ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගැන ආණ්ඩුවේ උපමාරුව ඒ වැඩේට ලොකු ඉඩක් සලසල දීල තියෙනව.

ඒකයි මං පෙන්නුවේ පඳුරට ගහපු එක නම් වැඩක් ඇති එකක් නෙවෙයි. නමුත් ඒ නිසා එළියට පැනපු නයාට මුහුණ දෙන එක නම් ලොකු ප්‍රශ්නයක් කියලා. මොකද? සෝමවංශ උන්නැහේ කියන විදියට නම් මේ ආණ්ඩුවේ වැඩපිළිවෙල නවත්වනකම් පහර පිට පහර දෙන්න යනවළු. එහෙම අරගලයක් ලොකු පරිමාණයෙන් වෙන එක නම් සිකුරුයි.

1971 දී සෝමවංශලා අරගලය දියත් කරන කොට ඒ අයට හිටියේ ගල්කටස්, අත්බෝම්බ, තැනින් තැන එකතු කරපු තරුණ තරුණියෝ දහ පාළොස්දාහක් පමණයි. හමුදා පොලීසිවල කිසිම වැදගත් හවුලක් ඔවුන්ට තිබුණේ නෑ.

ඊට වඩා වෙනස් තත්වයක් 1989 අරගලයේදී තිබුණා කියලා පෙන්වන්න පුළුවන්. ඒ වෙන කොට ආයුධවල තත්වයත් වෙනස්. ඊටත් වඩා ඔවුන්ට ලොකු බලයක් ශ්‍රීලනි පක්ෂය තුළින්ම මතු වෙලා තිබුණා. අනෙක් අතට හමුදා තුළත් ලොකු බලපෑමක් ඇති වෙලා තිබුණා.

අද වෙන කොට තත්වය ඊටත් වඩා දියුණුයි කියන්න පුළුවන්. සන්නද්ධ බලයක් දනට ඔවුන් රැස් කරගෙන නැතත්, හමුදා තුළ ඔවුන්ට ලොකු බලපෑමක් තිබෙන බව මානෙල් මල් ව්‍යාපාරයේ වැඩ බැළුවහම පෙනෙනවා. අනෙක් අතට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 40 පමණ හෝ ඊට වැඩි ගණනකගේ සහය ඔවුනට තිබෙනවා. රාජ්‍ය පරිපාලනය තුළත් එදාට වඩා ලොකු බලපෑමක් අද ඇති වෙලා තියෙනවා.

මේ සියල්ල තුළ ඔවුන් කරන මැදිහත් වීම ජාතිවාදී, ඒකාධිපති ගමනකට මහ පාදන්න පුළුවන්. මේ නිසා ජනතා විමුක්ති පෙරමුණෙන් දියත් කෙරෙන අරගලය ගැන වමේ ලොකු අවධානයක් ඇති විය යුතුයි.

මේකට මුහුණ දෙන්නට නම් බඩු මිල ගැනත්, යුද්ධය ගැනත්, ඊනියා ගෝලීය ධනවාදී සංවර්ධනය ගැනත් මතු කරමින් විකල්ප උද්ඝෝෂණ වටයක් දියත් කළ යුතු වෙනවා. මේ මගින් සමාජ අරගලය උස්සලා ජාතිවාදී අරගලයේ හුළං බැස්සවීමට වැඩ කටයුතු යොදන්න පුළුවන්.

ඔවුන් හදන්නේ මේකේ අනික් පැත්ත කරන්නටයි. ඒ කියන්නේ සමාජ ප්‍රශ්න ගැන ඇති වේදනාව ජාතිවාදී උද්සෝෂණයට නැත්නම් දේශප්‍රේමී උද්සෝෂණයට පාදක කර ගන්නටයි.

ඔවුන් ආණ්ඩුව සමඟ හැප්පෙන අය ලෙසට පෙනෙන කොට වැටිලා ඉන්න සාමාජිකයන් ආපහු ඔවුන්ට ඇදිලා එන්න පුළුවන්.

මහින්ද රාජපක්ෂ එදා ජේආර් ගෙන ගිය ප්‍රතිපත්තිවලට මාරුවෙලා ඉංදීය බලවතුන් මෙන්ම ගෝලීය බලවතුන්ගේ බංකොලොත් සැලසුම් ක්‍රියාවට දමද්දී එයට විරුද්ධව බරපතලම අරගලය වමෙන් කෙරෙන්නේ නැත්නම් ඒ වෙනුවට ජාතිවාදීන්ගේ රැල්ලක් මතු වෙන එක වලක්වන්න බෑ.

අද එක්සත් ජාතික පක්ෂය හිතන්නේ මේ ජාතිවාදී රැල්ල යටින් තමන්ට ඉස්සරහට එන්න පුළුවන් කියලයි. ඔවුන්ට එයින් මතු වන අනතුර ගැන කිසිම ගානක් නැති පාටයි. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණට උඩගෙඩි දෙන තැනට රනිල් වික්‍රමසිංහ බොහොම කණගාටුදායක ලෙසට වැටිලා තියෙනව.

සියල්ල යොමු වෙන්නේ මීළඟ ජනාධිපතිවරණය හැටියට තමයි වික්‍රමසිංහ මහත්තයා හිතන්නේ. ඒ ඈත ඉලක්කය තියාගෙන දැනට මොන මරාලය කරල හරි ඔළුව උස්සගෙන හිටියහම ඇති කියලා උන්නැහේ හිතන පාටයි.

ඔය සිතුවිලි උඩ ගියහම ගංවතුරට ගහගෙන යන්නත් පුළුවන්. මොකද? මේ රටේ සමාජ, ජාතික අරගල ඇතිවෙලා තියෙන්නේ පාර්ලිමේන්තුව තුළම නෙවෙයි. ඒකෙන් පිට.

ඔය 13 වැනි ව්‍යාවස්ථා සංශෝධනය ආවෙත් 1986 දී කැඳවපු වට මේසයෙන් මිස පාර්ලිමේන්තු කාරක සභාවකින් නෙවෙයි. රනිල්ට මතක නැහැ මීනිහ සාම ගිවිසුම ගැහැව්වෙත් පාර්ලිමේන්තුවට දන්වන්නේ නැතිව බව□